# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2085/19 - 2018 අගෝස්තු මස 23 වැනි බ්‍රහස්පතින්දා - 2018.08.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 15/2014

**2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත**

2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ 58 වන වගන්තිය සමඟ කියවිය යුතු, එම පනතේ 39 වන වගන්තිය යටතේ නිවාස සහ ඉදිකිරීම් අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

**සජිත් ප්‍රේමදාස,**
නිවාස සහ ඉදිකිරීම් අමාත්‍ය.

2018 අගෝස්තු මස 22 වැනි දින,
කොළඹ දී ය.

**නියෝග**

1. මෙම නියෝග 2018 ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන (විදේශීය කොන්ත්‍රාත්කරුවන් තාවකාලිකව ලියාපදිංචි කිරීමේ) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. ශ්‍රී ලංකාව තුළ යම් හඳුනාගත් ඉදිකිරීම් වැඩක නියුක්ත වීම සඳහා තාවකාලික ලියාපදිංචියක් ලබා ගැනීමට අපේක්ෂා කරන සෑම විදේශීය කොන්ත්‍රාත්කරුවකුම (මෙම නියෝගවල මින්මතු "අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය විසින් නියම කරනු ලැබිය හැකි යම් තොරතුරු ද සමඟ, අධිකාරියෙහි ලියාපදිංචි වීම පිණිස ඒ එක් එක් ව්‍යාපෘතිය සඳහා අයදුම්පත්‍ර ඉදිරිපත් කළ යුතුය.

3. එම ලියාපදිංචිය සඳහා වන කාර්ය පටිපාටිය මෙහි පළමු වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතුය.

1A - PG 004179 - 507 (2018/08)

මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

4. යම් විදේශීය කොන්ත්‍රාත්කරුවකු විසින් මෙහි දෙවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති අදාළ ලියාපදිංචි කිරීමේ ගාස්තු ගෙවීමෙන් පසු, එම කොන්ත්‍රාත්කරු වෙත ලියාපදිංචි අංකයක් ලබාදී එක් එක් ව්‍යාපෘතිය සඳහා තාවකාලික ලියාපදිංචි සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු අතර, එය එම සහතිකයේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව සඳහා වලංගු විය යුතුය.

5. අධිකාරිය සමඟ ලියාපදිංචි වූ සෑම විදේශීය කොන්ත්‍රාත්කරුවකුම එම ලියාපදිංචියෙහි කල් ඉකුත් වන දිනට අවම වශයෙන් දින දහහතරකට පෙරාතුව එම ලියාපදිංචි සහතිකය අලුත් කිරීම සඳහා මෙහි දෙවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති අලුත් කිරීමේ ගාස්තු ද සමඟ අධිකාරිය වෙත අයදුම්පතක් ඉදිරිපත් කළ යුතු ය.

6. මෙම නියෝගවල -

"හඳුනාගත් ඉදිකිරීම් වැඩ" යන්නට 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ එයට දී ඇති අර්ථයම තිබිය යුතුය.

## පළමුවන උපලේඛනය

### විදේශීය කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම හා ලියාපදිංචිය අලුත් කිරීම සඳහා වන කාර්ය පටිපාටිය

(1) (ලියාපදිංචිය/ලියාපදිංචිය අලුත් කිරීම සඳහා) අයදුම්පත්‍ර අධිකාරියෙන් ලබාගත හැකිය. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පහත ලේඛන සමඟ යවනු ලැබිය යුතුය.

(අ) කොන්ත්‍රාත්තුව පිරිනැමීමට අදහස් කරන සේවාදායකයාගෙන් ලිපියක් ;

(ආ) සමාගම පිළිබඳ සහතික කළ විස්තරයක් සහ සමාගමේ මූල්‍ය ප්‍රකාශය ;

(ඇ) වෘත්තිකයන් හා අනෙකුත් කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර ;

(ඈ) පෙර කාර්යසාධන විස්තර ;

(ඉ) ආනයනය කරන ලද යන්ත්‍රෝපකරණ පිළිබඳ විස්තර ; සහ

(ඊ) අධිකාරිය විසින් නියම කරනු ලැබිය හැකි වෙනත් යම් තොරතුරු.

(2) ලියාපදිංචියක් ලබා ගැනීම සඳහා අවශ්‍ය විය හැකි සියලු අවශ්‍යතාවයන් අයදුම්කරු විසින් සම්පූර්ණ කරන්නේ නම්, අයදුම්කරු වෙත ඒ පිළිබඳව අයදුම් කිරීමේ දින සිට සතියක කාලයක් තුළ දැනුම් දෙනු ලැබිය යුතුය.

(3) දෙවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ලියාපදිංචි ගාස්තුව/ලියාපදිංචිය අලුත් කිරීමේ ගාස්තුව ගෙවීමෙන් පසු ලියාපදිංචි සහතිකයක් අයදුම්කරු වෙත නිකුත් කරනු ලැබිය යුතුය.

(4) පහත දැක්වෙන හේතු මත ලියාපදිංචිය අලුත් කරනු ලබන අතර එම හේතු ලියාපදිංචි සහතිකය කල් ඉකුත්වීමේ දිනට දින දහහතරකට පෙර අධිකාරිය වෙත දැනුම් දෙනු ලැබිය යුතුය:-

(අ) ව්‍යාපෘතියෙහි විෂය පථය වෙනස් වීම සහ ඉන් අනතුරුව ගිවිසුම් වටිනාකම වැඩි වීම ;

(ආ) ව්‍යාපෘතිය අවසන් කිරීම සඳහා එම ව්‍යාපෘතියේ කාලය දීර්ඝ කිරීමට අවශ්‍ය වීම.

## දෙවන උපලේඛනය

| *ලියාපදිංචිය සඳහා වන ගාස්තුව* | *ලියාපදිංචිය අලුත් කිරීම සඳහා වන ගාස්තුව* |
| --- | --- |
| අදාළ ව්‍යාපෘතියේ ගිවිසුම් වටිනාකමින් 0.01%ක ප්‍රමාණයක්. | විෂය පථය වෙනස් වීමේදී හා ඉන් අනතුරුව ගිවිසුම් වටිනාකම වැඩි වීමේදී අදාළ ව්‍යාපෘති ගිවිසුම් වටිනාකම වෙනස් වීම නිසා දරන ලද අමතර වටිනාකමෙන් 0.01% ක ප්‍රමාණය. (ගිවිසුම් වටිනාකමෙහි වෙනස්වීමක් නොවන අවස්ථාවක දී අලුත් කිරීමේ ගාස්තු අදාළ නොවිය යුතු ය.) |

09 - 130

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.